# පුරාතන රාජ්‍ය පාලකයන් පරිසර සංරක්ෂණයෙහිලා අනුගමනය කළ ක්‍රියාමාර්ග ශිලා ලේඛන තුළින් හෙළිවන අයුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් ශිලා ලේඛන කිහිපයක් ඇසුරේන්)

*මධූෂාන් අයි.එම්.එම් [1] දුල්මිකා ආර්.එම්.ටි [2]*

පරිසර සංරක්ෂණය වනාහි පරිසර පද්ධතින් ආරක්ෂා කර ගනිමින් අනාගත පරපුර වෙනුවෙන් තිරසරව පරිසර හිතකාමී අයුරින් සංවර්ධනය කිරිමයි. “අප මේ මහ පොළොවේ කොටස්කරුවන් වන්නා සේම මහ පොළොව යනු අපේම කොටසකි”. ඇමරිකානු රතු ඉන්දියානු ඩුවාමිශ් ගෝත්‍රයේ ශ්‍රේෂ්ඨ නායකයෙකු වූ සියැටල්ගේ මෙම ප්‍රකාශය පරිසරය පිළිබඳ දර්ශනයන් අධ්‍යයනයෙදි වැදගත් වන්නා සේම තිරසර පරිසර සංරක්ෂණ න්‍යාය මත පිහිටමින් ඉපැරණි ලංකාවේ පාලනය ගෙන යන ලද බොහොමයක් රාජ්‍ය පාලකයන් පරිසරය ආරක්ෂා කිරීමට සිය අනුපමේය දායකත්වය ලබා දුන් අවස්ථා රාශියක් දැකගත හැකිය. එලෙස ලක්දිව පාලකයන් පරිසරය ආරක්ෂා කරගත් ආකාරය ශිලා ලිපි ඇසුරෙන් හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. පරිසර සංරක්ෂණයට ඉපැරණි රාජ්‍ය පාලකයන්ගේ දායකත්වය කෙබඳු ද යන්න අධ්‍යයනය කිරිම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. ගැටළුවට තොරතුරු සපයා ගැනීමට මහාවංශය , ශිලා ලේඛන ආදි ප්‍රාථමික මූලාශ්‍රත් , ලිපි සගරා වැනි ද්විතික මූලාශ්‍ර , සහභාගිත්ව නිරික්ෂණ ආදියත් මගින් විමර්ශනය සිදු කරන ලදී. ලක්දිව අතීත පාලකයන් බොහොමයක් පරිසරය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන ලදී. ඔවුහු වනාන්තර , ගංගා , ගස්වැල් ආදිය දේවත්වය හා මාතෘත්වය ආරූඪ කර පරිහරණය කරන ලද බව ශිලා ලේඛන වල සඳහන් වේ. හතරවන මිහිඳු රජතුමා විසින් පිහිටුවන ලද අනුරාධපුරයේ පුවරු ලිපියේ උස් ගොඩබිම්වල කැලෑ නොකැපිය යුතු බවට නියෝග කර ඇත. උස් ඉඩකඩම්වල ඇති වන සම්පත විනාශ කර දැමීම තුළින් පාංශු ඛාදනයත් එමඟින් නායයෑම් ආදියත් සිදුවන බවත් එයින් පැහැදිලි වේ. එසේ ම තුන්වන උදය රජතුමා විසින් පිහිටුවන ලද බුද්ධන්නේහෙල සෙල්ලිපියක “වල් වල දඬු පත් නොකපනු ඉසා” ලෙස සඳහන් වී ඇත. කැලෑ වල ගස් නොකැපිය යුතු බවත් එයින් සඳහන් වේ. පස්වන කාශ්‍යප රජතුමාගේ කොණ්ඩවට්ටවාන් ලිපියේ ද ගස් කොළන් කළමනාකරණයේ දී රජය විසින් පනවා ඇති නීති රීති පිළිබඳ ව සඳහන් වේ. අතිත රාජ්‍ය පාලකයන් පරිසරය ආරක්ෂා කරමින් පාලනය ගෙන යාමට කටයුතු කරන ලද ආකාරය ශිලා ලේඛනවල සඳහන් තොරතුරු ඔස්සේ නිගමනය කළ හැක.

**මුඛ්‍ය පද -** *ඉපැරණි , රාජ්‍ය පාලකයන් , පරිසර සංරක්ෂණ , ශිලා ලේඛන*

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පිඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය madushamilinda9@gmail.com

[2] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පිඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය thilinidulmika526@gmail.com